# කෝට්ටේ රාජධානි සමයෙහි විහාරස්ථ ඉඩම් හා බැඳි වහල් දැසිදස් පරපුර හා ඔවුන්ගේ සමාජ තත්ත්වය පිළිබඳ විමසුමක්

කුමාර එම්.ජේ.පී.

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

prasadmallawaarachchi85@gmail.com

**සාරසංක්ෂේපය**

කෝට්ටේ යුගයේදී ඉඩම් ප්‍රදාන සමග සිදුවන ලේඛාහොමයක් වහල් ප්‍රදාන සිදුවී ඇත්තේ විහාරාරාම වෙත ය. එනිසා වහලුන් විහාර සමගින් අත්‍යන්තයෙන් බැඳී සිටින ස්වභාවයක් දැකිය හැකි විය. කෝට්ටේ රාජධානි සමයෙහි විහාරස්ථ වහල් දැසිදස් පරපුර අත්පත් කරගත් සමාජ තත්ත්වය පිළිබඳ විමසුමක් මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. කෝට්ටේ රාජධානි සමයෙහි විහාරස්ථ වහලුන් අත්පත් කරගත් සමාජ තත්ත්වය යුරෝපීය වහලාගේ තත්ත්වයෙන් වෙනස් වීද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙම අධ්‍යයනය සිදු කිරීමේදී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදී. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේදී 15 වන සියවසේ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය, කොළඹ සහ මහනුවර රාජ්‍ය ලේඛනාගාරයන්හි තැන්පතු ලේඛන, යුගයට අදාළ සන්නස්, තුඩපත් හා විදේශිකයන්ගේ වාර්තා, රැසක් අධ්‍යයනයට ලක් කෙරිණි. එම සියලු දත්ත සන්සන්දනාත්මකව සහ විශ්ලේෂණාත්මක අධ්‍යයනය කරමින් නිගමනවලට එළඹෙන ලදී. පැපිලියාන ශිලා ලේඛනයේ දක්වන ආකාරයට පරිවාර ජනයාගෙන් දෙසිය පණහක් පැපිලියාන විහාරයට පූජා කර තිබේ. එතුළින් ගම්‍යමාන වන්නේ වහල් පිරිවර විහාර ඉඩකඩම්වලින් වෙන් කළ නොහැකි දේපළක් ලෙස පිළිගැනීමට ලක්වී ඇති බවයි. ගලපාත ලිපියේ දක්වන ආකාරයට කහඹල් කුලු මිදෙල්නා ඇතුළු පවුලේ අයට වහලුන් අයිති වන්නේ අන්වයාගත හා රන්වහල් යන ක්‍රම දෙකකිනි. එසේම විහාර දාසයන් විකිණීම හා මිළට ගැනීම නීතියෙන් තහනම් කළ බවට තොරතුරු පැපිලියානේ ශිලා ලේඛනයෙන්ම ඉදිරිපත් වේ. ඇතැම් විට මෙයින් අදහස් කරන්නට ඇත්තේ විහාරයට දාසයන් මිලදී ගැනීමට නොව විහාරයෙන් දාසයන් මිලදී ගැනීමට හෝ විහාර දාසයන් විකිණීමට නීතියෙන් තහනම් වන බව ය. විහාරස්ථ වහලුන් ආරාම සතු ඉඩම් අඳ ක්‍රමයට වගා කරමින් භික්ෂූන්ගේ කුදුමහත් අවශ්‍යතා පූරණය කරමින් කටයුතු කර තිබේ. ඒ අනුව කෝට්ටේ විහාරස්ථ වහලුන්ගේ අයිතීන් මනා ලෙස සුරක්ෂිත වූ අතර ඔවුන් භික්ෂුව ඇසුරේ වැඩෙමින් නිදහස් නිවහල් සමාජ ජීවිතයක් ගත කළ බව නිගමනය කළ හැකිය.

**ප්‍රමුඛ පද:** *වහල්භාවය, අන්වයාගත වහල්, රන්වහල්, පරිවාර ජනයා*